"විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු."
# ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
# பிரதம செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
# OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

"ශ්‍රාවස්ති මන්දිරය", 32, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ 07.
"சிராவஸ்தி" கட்டடம் ,32, ஸ்ரீமத் மார்க்கஸ் பர்ணாந்து மாவத்தை, கொழும்பு 07.
"Sravasthi Mandiraya", 32, Sir Marcus Fernando Mawatha, Colombo 07.

ප්‍රධාන ලේකම් / பிரதம செயலாளர் / Chief Secretary } දුරකථන / தொலைபேசி / Telephone - 2698409; ෆැක්ස් / பெக்ஸ் / Fax - 2694667; ඊ-මේල් / ஈ-மெயில் / Email chiefsecretary@wpc.gov.lk

පොදු දුරකථන / தொலைபேசி / General Telephone } 2682868, 2682869, 2682870

| | | |
|---|---|---|
| මගේ අංකය. / எனது இல. / My No. } CSWP/FIN-AP/03/FI/08 | ඔබේ අංකය. / உமது இல. / Your No. } | දිනය. / திகதி. / Date. } 2018.05. 18 |

## මූල්‍ය චක්‍රලේඛ 09/2018

ආණ්ඩුකාර ලේකම් (බ.ප.),
අමාත්‍යාංශ ලේකම්වරු (බ.ප.),
සභා ලේකම් (බ.ප.),
පළාත් කොමිෂන් සභාවල ලේකම්වරු (බ.ප.),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු (බ.ප.),
දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් (බ.ප.),

### ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරි ආයතනයට ගෙවිය යුතු වාර්ෂික සාමාජික දායකත්ව ගාස්තු ප්‍රතිපූර්ණය කිරීම.

උක්ත මැයෙන් යුතුව භාණ්ඩාගාර ලේකම් විසින් නිකුත් කරන ලද 2018.03.09 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 264/2018 හා බැඳේ. (එම චක්‍රලේඛයේ පිටපතක් මේ සමග අමුණා එවමි.)

02. ආණ්ඩුකාර ලේකම්ගේ අංක GOS/ADM/02/19/03/2018 හා 2018.05.15 දිනැති ලිපිය මඟින් ඉහත සඳහන් චක්‍රලේඛය බස්නාහිර පළාත් සභාවට අදාල කර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇති බව දැනුම් දී ඇත. එහෙයින් මෙම චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි.

ප්‍රදීප් යසරත්න,
ප්‍රධාන ලේකම්,පළාත් මුදල්
අමාත්‍යාංශ ලේකම් හා පළාත්
භාණ්ඩාගාර ලේකම්,
බස්නාහිර පළාත.

පිටපත: 01.විගණකාධිපති.
02. බස්නාහිර පළාතේ සියලුම ප්‍රාදේශීය ලේකම්වරු.
03.අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන)
04.තොරතුරු තාක්ෂණ නිලධාරි.


| නියෝජ්‍ය ප්‍රධාන ලේකම් / பிரதி பிரதம செயலாளர் / Deputy Chief Secretary | පාලන / நிர்வாகம் / Administration | පිරිස් හා පුහුණු / ஆளணி மற்றும் பயிற்சி / Personnel & Training | මූල්‍ය / நிதி / Finance | සැලසුම් / திட்டமிடல் / Planning | ඉංජිනේරු / பொறியியல் / Engineering | අධ්‍යක්ෂ අභ්‍යන්තර විගණන / பணிப்பாளர் உள்ளக கணக்காய்வு / Director Internal Audit |
|---|---|---|---|---|---|---|
| | Tel: 2693964<br>Fax:2669479<br>dcsadmin@cs.wpc.gov.lk | Tel: 2690058<br>Fax:2693952<br>dcspt@cs.wpc.gov.lk | Tel: 2693978<br>Fax:2679958<br>csfinance@wpc.gov.lk | Tel: 2693970<br>Fax:2676280<br>dsplancs@wpc.gov.lk | Tel: 2693968<br>Fax:2689900<br>dsengcs@wpc.gov.lk | Tel: 2689011<br>Fax:2689011 |

# මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
# நிதி மற்றும் வெகுசன ஊடக அமைச்சு
# MINISTRY OF FINANCE AND MASS MEDIA

මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව
செயலகம், கொழும்பு 01. இலங்கை
The Secretariat, Colombo 01. Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office - මුදල් / நிதி / Finance: (+94)-11-2484500, (+94)-11-2484600, (+94)-11-2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax - මුදල් / நிதி / Finance: (+94)-11-2449823
කාර්යාලය / அலுவலகம் / Office - ජනමාධ්‍ය / வெகுசன ஊடக / Mass Media: (+94)-11-2513459, (+94)-11-2513498, (+94)-11-2512324
ෆැක්ස් / பெக்ஸ் / Fax - ජනමාධ්‍ය / வெகுசன ஊடக / Mass Media: (+94)-11-2513458
වෙබ් අඩවි / வெப் சைட்கள் / Websites: www.treasury.gov.lk, www.media.gov.lk


මගේ අංකය / எனது இல. / My No.:
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2018.03.09

**රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක -: 264/2018**

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්

**<u>ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරී ආයතනයට ගෙවිය යුතු වාර්ෂික සාමාජික දායකත්ව ගාස්තු ප්‍රතිපූරණය කිරීම</u>**

ශ්‍රී ලංකාවේ රාජ්‍ය මූල්‍ය කළමනාකරුවන්ගේ වෘත්තීය අවශ්‍යතා සපුරාලීම සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් එහි රාජ්‍ය අංශ ඒකකය ලෙස රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරී සංගමය 2012 වසරේදී ස්ථාපිත කරන ලදී. මෙම සංගමය විගණකාධිපති, රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් හා දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් ඇතුළු 12 දෙනෙකුගෙන් සමන්විත අධ්‍යක්ෂ මණ්ඩලයක් විසින් කළමනාකරණය කරනු ලබයි.

02. ඒ අනුව, රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරී සංගමය හා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් එක්සත් රාජධානියේ වරලත් රාජ්‍ය මූල්‍ය සහ ගණකාධිකරණ ආයතනය සමඟ එක්ව 2015 වසරේ සිට වරලත් රාජ්‍ය මූල්‍ය ගණකාධිකරණ සුදුසුකම පිරිනැමීම සඳහා අවශ්‍ය පරීක්ෂණයන් පැවැත්වීම ආරම්භ කර ඇත. එහි මූලික පියවරක් ලෙස මූල්‍ය කළමනාකරණ විෂය සහිතව ව්‍යාපාර පරිපාලන පශ්චාත් උපාධි සුදුසුකම හෝ එයට සමාන හෝ ඉහළ සුදුසුකම් සහිතව කුසලතා පදනම මත තෝරාගත් දිපව්‍යාප්ත සේවාවල නියුතු ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ, විගණන සේවයේ, දේශීය ආදායම් සේවයේ සහ සුදුසුකම් ලත් අනෙකුත් රාජ්‍ය නිලධාරීන් හට මෙම සුදුසුකම පිරිනමන ලදී. දැනට සාමාජිකයන් 135 දෙනෙකු වරලත් රාජ්‍ය මූල්‍ය ගණකාධිකරණ සුදුසුකම ලබාගෙන ඇත.

03. මේ වන විට, ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරී සංගමයේ වෘත්තීය සාමාජිකත්වය අවස්ථා 03 ක් යටතේ ශ්‍රේණිගතව පවතින අතර 2018.01.01 දිනට බලපැවැත්වෙන එහි වාර්ෂික දායකත්වයන් පහත සඳහන් පරිදි වේ.

| | |
|---|---|
| රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරී සංගමයේ ආශ්‍රිත සාමාජිකත්වය (APFA) | රු. 1,000 |
| රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරී සංගමයේ අධි සාමාජිකත්වය (FPFA) | රු. 1,200 |
| වරලත් රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරී සාමාජිකත්වය (CPFA) | රු. 10,000 |

04. වරලත් රාජ්‍ය මූල්‍ය ගණකාධිකරණ සාමාජිකත්වය, සුදුසුකම්ලත් යෝෂ්‍ය රාජ්‍ය නිලධාරීන්ට පිරිනමන බැවින් වෘත්තීමය සංවර්ධනය තුළින් ලබාගත් දැනුම රාජ්‍ය නිලධාරීන් වශයෙන් ඔවුන්ගේ රාජකාරි කටයුතු සාර්ථකව ඉටුකිරීමට ඉවහල් වේ. සාමාජිකයන් විසින් මෙම එක් වෘත්තීමය සාමාජිකත්වයක් වෙනුවෙන් වාර්ෂිකව ගෙවිය යුතු සාමාජික මුදල් එම සාමාජිකයන් සේවය කරනු ලබන අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු මගින් දැරීම හෝ ප්‍රතිපූරණය කිරීම සම්බන්ධයෙන් භාණ්ඩාගාරයේ විරුද්ධත්වයක් නොමැත.

05. මෙම සංගමය විසින් රාජ්‍ය අංශයේ සාමාජිකයන්ට සංගමය විසින් සපයනු ලබන සේවාවන් තුළින් උපරිම ප්‍රතිලාභ ලබාගැනීමට පහසුකම් සලසන මෙන් ද මේ මගින් ඉල්ලා සිටිනු ලැබේ..

06. 2009.02.10 දිනැති SA/AS/DG/1 දරණ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශ ලිපිය මෙම චක්‍රලේඛ දිනයේ සිට බලපැවැත්වෙන පරිදි අවලංගු වේ.

07. මෙම චක්‍රලේඛයේ සඳහන් තොරතුරු සම්බන්ධයෙන් තවදුරටත් පැහැදිලිකිරීමක් අවශ්‍ය වන්නේ නම් රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල් (දු.ක.0112484728, ෆැක්ස් - 0112473856) ඇමතීමෙන් ලබාගත හැක.

**ආර්.එච්.එස්. සමරතුංග**

**භාණ්ඩාගාර ලේකම්**

පිටපත්:

1. විගණකාධිපති